# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2455/06 - 2025 සැප්තැම්බර් මස 22 වැනි සඳුදා - 2025.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 7412 දරන සහ අංක 502, පේරාදෙණිය පාර, නුවර යන ලිපිනයෙහි පිහිටා ඇති සමාගමක් වන "ද ඇමරිකන් කොලේජ් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙහි I වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වැනි උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුමට අනුරූපීව මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ දක්වා ඇති උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් "ද ඇමරිකන් කොලේජ් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය මෙම නියමය මගින් පිළිගනු ලැබේ.

**I වන උපලේඛනය**
**කොන්දේසි**

1. (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ද ඇමරිකන් කොලේජ් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 6 වන ස්ථරයේ) මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්,

   අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂයය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම;

   යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

1A - PG 7256 - 284 (2025/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. ආයතනය විසින්, මෙහි II වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට සම්බන්ධ උපාධි පාඨමාලාව අංක 502, පේරාදෙණිය පාර, නුවර යන ස්ථානයේ පමණක් පැවැත්විය යුතුය.

3. ආයතනය විසින්, මෙම නියමය ප්‍රකාශයට පත්කළ දිනයේ සිට සෑම වසර පහකට (5) වරක් නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන සමාලෝචනයට යටත්ව මෙහි II වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමිය යුතුය.

**II වන උපලේඛනය**

| *I වැනි තීරය*<br>*උපාධිය* | *II වැනි තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (මනෝවිද්‍යාව) |

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0209